**ශීර්ෂය 185 - විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය**
**විගණකාධිපති වාර්තාව - 2013 වර්ෂය**
**------------------------------------------------------------**

**විගණන විෂය පථය**
**-------------------**

විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 අගෝස්තු 01 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ වගකීම
---------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

1.3 විගණන නිරීක්ෂණ
----------------------

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.10 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ) විසර්ජන ගිණුම

-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මුළු ප්‍රතිපාදනය හා වියදම

------------------------------

අමාත්‍යාංශය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. 1,000,780,000 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ඉන් රු. 963,252,683 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. 37,527,317 ක් හෙවත් සියයට 4 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

2013 දෙසැම්බර් 31 දිනට

| වියදම | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | |
| පුනරාවර්තන | 113,800,000 | 102,161,088 | 11,638,912 | 10 |
| මූලධන | 886,980,000 | 861,091,595 | 25,888,405 | 2.9 |
| එකතුව | 1,000,780,000 | 963,252,683 | 37,527,317 | 4 |

(ii) අයවැය විචලනය

--------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- වැය විෂයයන් 04 ක් සඳහා සළසා තිබුණු රු. 2,050,000 ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

- වැය විෂයයන් 23 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 6 සිට සියයට 94 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

- අමාත්‍යාංශයේ අරමුණු ලඟා කර ගැනීම සඳහා අවශ්‍ය සැලසුම් සම්පාදනය කර එමගින් අවශ්‍යතාවයන් හඳුනා ගෙන ඇස්තමේන්තු සකස් කිරීමකින් තොරව කල්පිත පදනම මත ඇස්තමේන්තු සකස් කිරීම හේතුවෙන් වැය විෂයයන් 10 කට මුදල් රෙගුලාසි 66 මගින් රු. 213,821,948 ක මුදලක් මාරු කර ගෙන තිබූ අතර පරිපූරක ඇස්තමේන්තු මගින් වැය විෂයයන් 04 කට රු. 457,500,000 ක මුදල් ප්‍රතිපාදනයක් සළසා ගෙන තිබුණි.

(ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

---

පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

---

අමාත්‍යාංශයට අදාල විෂය අංක 18501 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| විෂය අංකය | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 18501 | 2,800,000 | 1,298,636 | 400,000 | 750,812 | 7,000,000 | 4,036,658 |

(ඇ) අග්‍රිම ගිණුම

---

අමාත්‍යාංශයේ 2013 දෙසැම්බර් 31 දිනට 7002/0000/00/0419/0013/000 දරන අග්‍රිම ගිණුමේ ශේෂය රු. 39,110,354 ක් විය. 2014 අප්‍රේල් 30 දින වනවිට අමාත්‍යාංශය පියවා නොතිබුණු අග්‍රිම ශේෂ එකතුව රු. 39,032,040 ක් වී තිබුණි. මෙම ශේෂ 2012 හා 2013 වර්ෂවලදී දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් කළ ඉදිකිරීම් 03 කට අදාලව කොන්ත්‍රාත්කරුවන් තිදෙනෙකුට ගෙවන ලද අත්තිකාරම් හා අතුරු ගෙවීම් විය.

(ඇ) පොදු තැන්පත් ගිණුම

---

අමාත්‍යාංශයේ 2013 දෙසැම්බර් 31 දිනට 6000/0000/00/0015/0187/0000 දරන පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු. 39,032,040 ක් විය. දැයට කිරුළ ප්‍රදර්ශනයේ කාර්යයන් සඳහා කොන්ත්‍රාත්කරුවන් තිදෙනෙකුට ලබාදී තිබුණු රු.39,032,040 ක අත්තිකාරම්, වියදම් ලෙස ගිණුම්ගත කිරීම නිසා මෙම ශේෂය ඇති වී තිබුණි.

1.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

---

1.4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

---

2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ 1.4.1 ඡේදය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතුය. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් 2013 ජූනි 13 දින පිළියෙල කර තිබුණද එය අමාත්‍යාංශයේ සියළුම කාර්යයන් ඇතුළත් වන පරිදි සකස්කර නොතිබුණි.

1.4.2 අභ්‍යන්තර විගණනය

-------------------------

මුදල් රෙගුලාසි 133 අනුව 2013 සැප්තැම්බර් දක්වා අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණ අතර එය ඔක්තෝබර් මාසයේදී ස්ථාපිත කර තිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

1.5 වත්කම් කළමනාකරණය

------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම

-----------------------------------------------------------------

වෙනත් ආයතන සතුව තිබුණු වාහන 04 ක් පවරා ගැනීමකින් තොරව අමාත්‍යාංශය විසින් භාවිතයට ගෙන තිබුණි. දැනට එයින් එක් වාහනයක් අපහරණ තත්ත්වයේ පැවැතුණි.

(ආ) බේරුම් නොකළ බැරකම්

------------------------------

අමාත්‍යාංශය විසින් 2013 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් රු. 131,461,871 ක් වූ අතර එම බැරකම් වර්ෂයක කාලයකට අඩු ඒවා විය.

1.6 අනුකූල නොවීම්

--------------------

නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

---------------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසි විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | මුදල් රෙගුලාසි 1645 | සංචිත වාහන 06 ක ධාවන සටහන් ඉදිරිපත් කර නොතිබුණි. |

(ආ ) ජනාධිපති ලේකම්
කාර්යාල චක්‍රලේඛ
-----------------------

| | |
|---|---|
| 2010 මැයි 14 දිනැති අංක සීජ්/1/17/1 දරන චක්‍රලේඛයේ 3.1 ඡේදය | අමාත්‍යවරුන්ගේ පරිහරණය හා ආරක්ෂක කටයුතු වෙනුවෙන් වෙන්කරනු ලබන උපරිම වාහන සංඛ්‍යාව 03 ක් වුවද, මෙම අමාත්‍යාංශය භාර අමාත්‍යවරයා වෙත වාහන 04 ක් වෙන්කර තිබුණි. ඊට අමතරව සංචිත වාහන 06 ක් හා තවත් වාහනයක් අදාල අමාත්‍යවරයා විසින් පාවිච්චි කර තිබුණි. |

1.7 කාර්යසාධනය
------------------

2013 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) සැලැසුම් කිරීම
------------------

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ක්‍රියා නොකිරීම
--------------------------------------------------------------

පහත සඳහන් අවස්ථාවලදී සිදු කර තිබුණු කාර්යයන් පිළියෙල කර තිබුණු වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූල වී නොතිබුණි.

(i) විගණනය සඳහා ලබාදුන් සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉ-ශිල්පාගාර 328 ක් ඉදිකර නිමකිරීමට සැලසුම් කර තිබුණ අතර ඉන් එක් ඉ-ශිල්පාගාරයක් සඳහා පරිගණක හා උපාංග සහිතව ගොඩනැගිල්ලක් ලබාදීමට රු. මිලියන 4.2 ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණි. ඒ අනුව මුළු ඇස්තමේන්තු මුදල රු. මිලියන 1,377.6 ක් වුවද ක්‍රියාකාරී සැලැස්මේ ඇස්තමේන්තු ගත මුදල හෝ එක් ඉ- ශිල්පාගාරයක් සඳහා වැය වන මුදල් දක්වා නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය සඳහා මෙම ශිල්පාගාර ඉදිකිරීම සඳහා සළසා තිබුණු ප්‍රතිපාදනය රු. මිලියන 395 ක් පමණක් වූවත්, 2013 වර්ෂය තුළදී ඉ- ශිල්පාගාර ඉදිකිරීමේ ප්‍රගතිය සියයට 29 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙහි ඉලක්ක ලඟාකරගෙන නොතිබුණු අතර එය ඵලදායී කාරකයක් ලෙසද යොදාගෙන නොතිබුණි.

(iii) මෙම ඉදිකිරීම් 2014 වර්ෂයේදී සම්පූර්ණයෙන් නිමකිරීමට නැවත සැලසුම් කර ඇති අතර 2014 ජූනි 06 දින වන විට ඉ- ශිල්පාගාර 130 ක් විවෘත කර ඇති බවත්, තවත් ශිල්පාගාර 95 ක් විවෘත කිරිමට ඇති බවත් ශිල්පාගාර 106 ක් නිමකිරීමට ඇති බවත් විගණනයට වාර්තා කර තිබුණි.

1.8 මතභේදයට තුඩුදෙන ගනුදෙනු
----------------------------------

අමාත්‍යාංශය විසින් සිදුකර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහතින් දැක්වේ.

(අ) ආපන ශාලාව ඉදිකිරීම සඳහා වූ මිලගණන් අතුරින් අවම මිල රු. 11,135,250 බැගින් ආයතන 02 ක් ඉදිරිපත් කර තිබුණි. ප්‍රතික්ෂේප කිරීමට විශේෂිත හේතු නොදක්වා එම මිලගණන් ප්‍රතික්ෂේප කර ඊළඟ අවම මිල ගණන් ඉදිරිපත් කළ කොන්ත්‍රාත්කරු වෙත රු. 12,066,600 කට ලංසුවකට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි.

(ආ) දැයට කිරුළ ප්‍රදර්ශන පරිශ්‍රයේ තාවකාලික වැසිකිලි ඉදිකිරීමට ලංසු කැඳවා තිබුණි. එක් පද්ධතියක් රු.575,000 බැගින් පද්ධති 49 ක් නියමිත දිනට ඉදිකරන බවට ලංසු ඉදිරිපත් කර තිබුණු ලංසුකරුවන් තිදෙනෙකුට එම කොන්ත්‍රාත්තුව ලබා දිය යුතු බව ඇගයිම් කමිටුව නිර්දේශ කර තිබුණි. ඊට පටහැනිව ඉදිකිරීම් කටයුතු නියමිත දිනට නිම කිරිමට එකඟ නොවූ ලංසුකරුවෙකුගේ ලංසුව ඇගයීම් කමිටුව විසින් ප්‍රතික්ෂේප කර තිබුණත්, දැයට කිරුළ ප්‍රධාන විධායක නිලධාරී විසින් 2013 ජනවාරි 07 දින එම ප්‍රතික්ෂේප කළ ලංසුකරු වෙත එක් පද්ධතියක් රු.575,000 බැගින් නිමකිරීමට එම කොන්ත්‍රාත්තුව පවරා තිබුණි.

(ඇ) එකඟ වූ පිරිවිතරවලට අනුව වැසිකිලි ඉදිකිරීම සිදු නොකිරීම නිසා ලබාදී තිබූ කොන්ත්‍රාත්තුව 2013 මාර්තු 08 දින අවලංගු කර තිබුණි. ඒ වන විට එම කොන්ත්‍රාත්කරුට රු.15,000,000 ක් ගෙවා තිබුණි. කොන්ත්‍රාත්කරු විසින් ඉදිකරන ලද නමුත් නිමනොකළ වැසිකිලි පද්ධති 23 ක වැඩ නිමකිරීමට අම්පාර නගර සභාවට භාරදී ඒ වෙනුවෙන් රු.1,900,000 ක් ගෙවා තිබුණි. ප්‍රසම්පාදන පරිපාටියේ සිදුව තිබූ දුර්වලතා හේතුවෙන් අපේක්ෂිත වැසිකිලි පද්ධති ප්‍රමාණයෙන් 26 ක් ඉදිකර නොතිබුණ අතර ඉදිකළ වැසිකිලි පද්ධති සඳහා රු.3,675,000 ක අමතර වැයක් කර තිබුණි.

(ඈ) 2013 දැයට කිරුළ සංවර්ධන ප්‍රදර්ශනයේ ඉදිකිරීම් වෙනුවෙන් වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදලට අමතරව කොන්ත්‍රාත්කරුවන්ට රු.30,296,373 ක් ගෙවා තිබුණද ගෙවීම් සනාථ කිරීම සඳහා මිණුම් වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. මෙම ගනුදෙනු මුදල් රෙගුලාසි 237(අ) පටහැනිව සිදු කිරීම නිසා අදාල ගෙවීම්වල නිරවද්‍යතාවය පරීක්ෂා කිරීමට නොහැකි විය.

(ඉ) කියවීම් ශාලාව ඉදිකිරීමේදී එම ගොඩනැගිල්ලේ දොරවල් සහ ජනෙල් ඇලුමිනියම් යොදා නිමකිරීමට කොන්ත්‍රාත්කරුගේ ප්‍රමාණපත්‍රයට අනුව තීරණය කර තිබුණද ඒ සඳහා රු. 1,185,500 ක් වටිනා දැවයෙන් නිමකරන ලද ලූවර්ස් දොරවල් හා උළුවහු කොළඹට ආසන්න ප්‍රදේශයකින් මිලදී ගෙන තිබුණි.

1.9 අවිධිමත් ගනුදෙනු

---------------------
ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම
-----------------------------------------------------------

2013 දැයට කිරුළ සංවර්ධන ප්‍රදර්ශනය වෙනුවෙන් තාවකාලික වැසිකිලියක්, ආපන ශාලාවක් හා කියවීම් ශාලාවක් ඉදිකිරීම සඳහා පිළිවෙලින් රු.32,458,041, රු.12,066,600 හා රු.18,678,330 ක් වශයෙන් ප්‍රසම්පාදනයන් කර තිබුණි. එම ප්‍රසම්පාදනයන් සම්බන්ධයෙන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුගමනය නොකළ අවස්ථා පහත පරිදි නිරීක්ෂණය විය.

(අ) සුදුසුකම් සහිත හා උනන්දුවක් දක්වන සියළු පාර්ශවයන්ට සාධාරණ හා සමාන අවස්ථාවන් උපරිම ලෙස සැලසෙන අයුරින් 1.2.1 (සී) මාර්ගෝපදේශයට පටහැනිව කර්මාන්තය සඳහා විවෘත මිල ගණන් කැඳවීමකින් තොරව ආයතන 4 කින් පමණක් මිල ගණන් කැඳවා තිබුණි. මේ හේතුවෙන් රජයට අවම පිරිවැයක් යටතේ ගුණාත්මකභාවයකින් යුතුව ඉදිකිරීම් කටයුතු ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) 5.2.1 මාර්ගෝපදේශය ප්‍රකාරව ලංසු කැඳවීමේ ලේඛනයේ ප්‍රමාණ බිල්පත්‍ර ඇතුළත් කිරීම අත්‍යාවශ්‍ය කරුණක් වුවත්, ආපන ශාලාවක් හා කියවීම් ශාලාවක් ඉදිකිරීම වෙනුවෙන් වූ ප්‍රසම්පාදනවලදී එවැනි ප්‍රමාණ බිල්පත්‍ර සකස් කර නොතිබුණි.

(ඇ) 5.3.5 මාර්ගෝපදේශය ප්‍රකාරව ඉදිකිරීම් සඳහා වූ කොන්ත්‍රාත්කරුවන් තිදෙනා අයි.සී.ටී.ඒ.ඩී (ICTAD) හි ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ද යන්න තහවුරු කර ගෙන නොතිබුණි.

(ඈ) කියවීම් ශාලාව ඉදිකිරීමේ කර්මාන්ත වෙනුවෙන් මිල ගණන් ඉදිරිපත් කරන ලද කොන්ත්‍රාත්කරුවන්ගෙන් 5.3.11 මාර්ගෝපදේශය ප්‍රකාරව ලංසු සුරක්ෂණ ලබාගෙන නොතිබුණි.

(ඉ) 5.4.4.(1) මාර්ගෝපදේශය ප්‍රකාරව සුරක්ෂණයක් ඉදිරිපත් කිරීම මත කොන්ත්‍රාත් මුදලින් උපරිම සියයට 20 ක අත්තිකාරම් ගෙවිය හැකි වුවද, ඉහත සඳහන් ඉදිකිරීම් 03 සඳහා අත්තිකාරම් ගෙවීමේදී එවැනි සුරක්ෂණ ලබාගෙන නොතිබුණි.

(ඊ) ආපන ශාලාව හා වැසිකිලි ඉදිකිරීමේ කර්මාන්තයේදී 5.4.8 මාර්ගෝපදේශය ප්‍රකාරව කාර්යසාධන බැඳුම්කර ලබාගෙන නොතිබුණි.

(උ) කියවීම් ශාලාව හා ආපන ශාලාව ඉදිකිරීමේදී 8.1 මාර්ගෝපදේශය ප්‍රකාරව ඇගයීම් කමිටු නිර්දේශ ලබාගෙන නොතිබුණි.

1.10 මානව සම්පත් කළමනාකරණය

-------------------------------------

අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

---------------------------------------------------------

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 09 | 08 | 01 |
| තෘතීයික මට්ටම | 04 | 03 | 01 |
| ද්වීතික මට්ටම | 33 | 13 | 20 |
| ප්‍රාථමික මට්ටම | 20 | 15 | 05 |
| වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 01 | 01 | - |
| | 67 | 40 | 27 |

සමාලෝචිත වර්ෂය අවසාන වනවිට පුරප්පාඩු 27 ක් පිරවීමට අපොහොසත් වී තිබුණි.